ප්‍රශංසා එකතු සුපවත

2018 පෙබරවාරි මස 05 වන දින සිට පෙබරවාරි මස 11 වන දින දක්වා

**විශ්වාසය ඇත්නම් දෙවියන් වහන්සේගේ තේජශ්‍රීය දැකිය හැකිය**

01. ප්‍රශංසාව සඳහා :

සමිඳුන් කෙරෙහි ප්‍රීතිමත් වන්න. එතුමන් ඔබේ මන දොල ඉටු කරනු ඇත. ඔබේ ඉරණම හිමිතුමන්ට භාර දෙන්න. එතුමන් කෙරෙහි විශ්වාසය තබන්න. හිමිතුමන් හැම දෙයම ඉටු කර දෙනු ඇත. (ගීතාවලිය 37:4-5)

අප යාච්ඤා කරන විට උද්‍යෝගයෙන් ද, ජ්වලිතව ද යාච්ඤා කළ යුතුයි. ප්‍රීතිමත් සිතකින් අපි ඔවුන් වහන්සේට තුති පැසසුම් පුද කළ යුතුය. යාච්ඤාව තුළ අප බලාපොරොත්තු වන දෙය සැබෑවක් වන්නට නම් සමිඳාණන්ගේ ප්‍රේමය කෙරෙහි ස්ථිරත්වය අපි මෙසේ පල කරමු.

පුබුදු ගී අංක 07 "සුදත් සුරිඳුනේ අප සිත් සනසා ......"

02. පසුගිය සතියේ අත්දැකීම් බෙදා ගෙන කෙටි ප්‍රශංසාවකට ඇතුළු වෙමු.

03. සතියේ සුපුවත :

i වචනයේ සේවකයා මෙන්ම කීප දෙනෙකු විසින් විශ්වාසයේ තෑග්ග මුල් කරගෙන දෙවියන් වහන්සේගේ තේජශ්‍රීය අත්දුටු අවස්ථාවන් බෙදා ගන්න.

ii සමිඳාණන් කෙරෙහි අපගේ විශ්වාසය වර්ධනය කර ගැනීමට, විශ්වාසය බලවත් කර ගැනීමට අප විසින් කුමක් කළයුතුදැයි පහත දැක්වෙන ශුද්ධ ලියවිලි පාඨය කියවා බෙදා ගන්න.

**"ඔබ ජේසුස් වහන්සේ සමිඳාණන් වහන්සේ යයි ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන්නෙහි නම්, දෙවියන් වහන්සේ ඔවුන් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන කළ බව සිතින් අදහන්නෙහි නම් ඔබ ගැළවීම ලබන්නෙහිය..... "** (රෝම 10:9-10)

04. වචනයේ සේවකයා සඳහා :

* ඔබ/ මා තුළ විශ්වාසය බලවත් කර ගැනීමටත්, විශ්වාසයේ බලය ප්‍රකාශ වීමටත් ඉතා බලගතු ක්‍රමවේදය නම් ජේසුස් වහන්සේ අපගේ එකම සමිඳාණන් වහන්සේ යයි ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමත්, ඔවුන් වහන්සේ සෑමදාමත් ඒකාකාරවම ජීවමානව අප තුළ අප අතර වැඩසිටින බව අදහා ගැනීමයි. ඊට සාක්ෂි දැරීමයි.
* ශු.ජොහාන් 11:4 **"මේ රෝගය මරණයෙන් කෙළවර වන්නේ නොවේ. මෙය දේව මහිමය සඳහාය. මෙයින් දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් මහිමයට පමුණුවනු ලබන සේකැයි වදාළ සේක. "**
* ශු.ජොහාන් 11:41 **"ජේසුස් වහන්සේ ඇස් ඔසොවා, 'පියාණෙනි ඔබ මට සවන් දුන් නිසා ම ඔබට ස්තුති කරමි. සැමවිටම ඔබ මට සවන් දෙන බව මම දැන සිටියෙමි. එහෙත් මා මේ දේ කීවේ ඔබ මා එවා වදාළ බවට අවට සිටින සමූහයා අදහා ගන්න පිණිස ය'යි වදාළ සේක."**
* ජේසුස් වහන්සේ තුළ තිබූ විශ්වාසය කොයි තරම් ඉමහත්ද? සැකයෙන් තොරද? ස්ථිරද? ඒ වනවිට ප්‍රාතිහාර්ය සිදුවී නැතත් ජේසුස් වහන්සේ ඉමහත් විශ්වාසයෙන් යුතුව තම පියාණන්ට යාච්ඤා කළ අයුරු දකිමු.
* අපගේ හදවතේ නමස්කාරය පුදමින් අපගේ නෙත් සිත්, හදවත් ඔවුන් වහන්සේ කෙරෙහි මොහොතක් යොමු කර සිටිමු.

05. අවසාන යාච්ඤාව :

* ශු.මාක් 11:24 "ඔබ යාච්ඤාවෙන් අයදින කවර දෙයක් වුවද එය ඔබට ලැබුණේ යයි අදහන්න. එවිට එය ඔබට ලැබෙන්නේමය."

පුබුදු ගී අංක 54 " ජීවනයේ ස්වාමිනි ........."

========================

ප්‍රශංසා එකතු සුපුවත
2018 පෙබරවාරි මස 12 වන දින සිට පෙබරවාරි මස 18 වන දින දක්වා
**දෙවියන් වහන්සේගේ බලය අත්දැකීමේ මාර්ගය විශ්වාසයයි**

ප්‍රශංසා එකතු සුපුවත
2018 පෙබරවාරි මස 12 වන දින සිට පෙබරවාරි මස 18 වන දින දක්වා
**දෙවියන් වහන්සේගේ බලය අත්දැකීමේ මාර්ගය විශ්වාසයයි**

01. ප්‍රශංසාව සඳහා :

* ප්‍රශංසාව දෙවියන් වහන්සේ කෙරෙහි අචල විශ්වාසයෙන් යුතුව ජීවත්වන්නාගේ මුවින් නික්මෙන මිහිරි ගීතයකි. මුවින් ප්‍රකාශ කිරීම විශ්වාසයේ බලය ප්‍රකාශ වීමේ බලගතු ක්‍රමයයි. දෙවියන් වහන්සේට එම මිහිරි ගීතය ගයන්නට හැක්කේ ඔවුන් වහන්සේව අත්දකින අයටයි. ඔවුන් වහන්සේ හා ගැඹුරු සබැඳියාවකට ඇතුළු වෙමින් විශ්වාසයේ ජීවිතයක් ගත කරන්නන් ලෙස දෙවියන් වහන්සේගේ බලය අත්දුටු විශ්වාසයේ අත්දැකීම් සමඟ ප්‍රශංසාවට ඇතුළු වෙමු.
* කොලොස්සි 2:6-7 **" එබැවින් ඔබ ක්‍රිස්තුන් ජේසුස් වහන්සේ සමිඳාණන් වහන්සේ වශයෙන් පිළිගෙන තිබෙන බැවින් ඔවුන් වහන්සේ තුළ මුල් ඇදගන්නා පරිදි ස්ථිරව සිටින්න; ඔබට උගන්වන ලද ඇදහිල්ලේ පිහිටා සිටින්න. බෙහෙවින් තුති පුදන්න. "**

* පුබුදු ගී අංක 19 "අප ජීවනයද ......"

02. පසුගිය සතියේ අත්දැකීම් ළඟ සිටින කෙනෙකු සමඟ සාංඝික කර ගනිමින් කෙටි ප්‍රශංසාවකට ඇතුළු වන්න.

03. සතියේ සුපුවත :
* විශ්වාසය දෙවියන් වහන්සේගේ බලය අත්දකින්නට හැකි මාර්ගයයි.
* අදහන්නා තුළින් දෙවියන් වහන්සේගේ ප්‍රබල ක්‍රියා ප්‍රකාශ වේ. විශ්වාසය හැකියාවක් නොව, ස්වඋත්සාහයෙන් උපදවා ගත හැකි දෙයක් නොව, බලයකි - තෑග්ගකි - දීමනාවකි.

i එසේ නම් දෙවියන් වහන්සේගේ බලය අත්දකින්නට හැකි විශ්වාසයේ ත්‍යාගය ලබා ගන්නට අප කළ යුත්තේ කුමක්දැයි සාකච්ඡා කරන්න.
ii විශ්වාසයේ බලය ඉතා ගැඹුරින් අත්දුටු අවස්ථාවන් එකිනෙකා සමඟ බෙදා ගන්න.
iii එසේම විශ්වාසයේ බලය අත්දකිමින් ක්‍රිස්තුන් වහන්සේට සාක්ෂි දරන්නට ඔබ ගෙන ඇති පියවරයන් සාකච්ඡා කරන්න.

04. වචනයේ සේවකයා සඳහා :
* අපට ආධ්‍යාත්මික බලය ලබා ගැනීමට ඇති එකම මාර්ගය විශ්වාසයයි. විශ්වය ආරම්භයේ සිටම අප ජීවත් වන අවකාශය තුළ ආකර්ශණ තරංග, ගුවන් විදුලි තරංග වැනි භෞතික බලයන් පැවතුන නමුත්, එම බලය ලබා ගැනීමට මිනිසුන් නොදත්හ. කාලයත් සමඟ මේ බලය හා සම්බන්ධතා පවත්වමින් විදුලි බලය, තාප බලය, න්‍යෂ්ඨික බලය වැනි භෞතික බලයන් සොයා ගැනීමට මිනිසා සමත් විය. එහෙත් එම භෞතික බලයට වඩා අධික බලයකින් යුත් ආධ්‍යාත්මික බලයක් ඇත. දෙවියන් වහන්සේගේ බලය මේ මොහොතේදීත් අප සමඟයි. එම බලය ලබා ගතයුතු මාර්ගය විශ්වාසයයි.

**"සැබැවින්ම මම ඔබට කියමි. කවරෙක් නමුත් මේ කන්දට ඉදිරී ගොස්, මුහුදෙහි පතිත වේවා'යි කියා, තමා කියන දේ සිදු වන්නේම යයි නිසැක සිතින් අදහන්නේ නම්, එය සිදුවන්නේමය. එබැවින් මම ඔබට කියමි, ඔබ යාච්ඤාවෙන් අයදින කවර දෙයක් වුවද එය ඔබට ලැබුණේ යයි අදහන්න. එවිට එය ඔබට ලැබෙන්නේම ය. "** (ශු.මාක් 11:23-24)

05. සතිය පුරා ප්‍රායෝගිකව :

* ඔබේ විශ්වාසය මෙතරම් ප්‍රබලද සිතා බලන්න.
* මුවින් ප්‍රකාශ කිරීම විශ්වාසයේ බලය ප්‍රකාශ වන ප්‍රබල මාර්ගයකි. විශ්වාසයට සාක්ෂි දරන්නට ඔබ තුළ ඇති අවදිවීම කොතෙක්ද?
* විශ්වාසයේ බලය අත්දකින්නට පිපාසිත වෙමු.

06. අවසාන යැදුම : පුබුදු ගී අංක 95 "ඔබ තෝරා ගත් ....."

****************